# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
# முதியோர்களுக்கான தேசிய செயலகம்
# National Secretariat for Elders

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා -செயலூக்கமான முதுமையை நோக்கி - *Towards an active ageing*


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NSE/DEV/03/02 | ඔබේ අංකය<br>உனது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.04. 11 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>" ආරෝග්‍යා" වැඩිහිටි මූල්‍යාධාර වැඩසටහන- 2025</u>**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින්, වැඩිහිටි ප්‍රජාවගේ සුබසාධනය ඉහළ නැංවීම උදෙසා විවිධ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන අතර "ආරෝග්‍යා" වැඩිහිටි මූල්‍යාධාර වැඩසටහන 2025 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇත.

02. ඒ අනුව, වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය ගැටළු හමුවේ වන මූල්‍ය දුෂ්කරතා අවම කිරීම වෙනුවෙන් යම් සහනයක් සැලසීම අරමුණු කරගනිමින්, අවුරුදු 60 සම්පූර්ණ වූ, අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ආධාර ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකිරීමට අපේක්ෂිතය.

03. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ පහත සඳහන් ලේඛන මේ සමග ඉදිරිපත් කරන අතර, මෙම සියලුම ඇමුණුම් (01 සිට 04 දක්වා) www.srilankaeldercare.gov.lk වෙබ් අඩවියේ පලකෙරෙන බැවින් ඒ මගින් ද මෙම තොරතුරු ලබාගත හැකි ය.

- ඇමුණුම 01 - උපදෙස් පත්‍රිකාව
- ඇමුණුම 02 - ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය
- ඇමුණුම 03 - අදාළ ඉල්ලුම්පත්‍රය
- ඇමුණුම 04 - මූල්‍ය ප්‍රගති වාර්තාව

04. ඉහත වැඩසටහන යටතේ පසුගිය වර්ෂයේ (2024) ඉල්ලීම් ඉදිරිපත්කර, මෙතෙක් ආධාර ලැබී නොමැති වැඩිහිටියන් අතුරින්, නව නිර්ණායක වලට අනුකූල ප්‍රතිලාභීන් සඳහා ඇමුණුම 02 ආකෘතිය මගින් නැවත ඉල්ලීම් කළයුතු වේ. මෙහිදී, එම ඉල්ලුම්කරුවන් විසින් ඔබ වෙත ඉදිරිපත්කර ඇති අයදුම්පත්‍රයම අදාළ කරගතයුතු අතර, නව අයදුම්පත්‍ර ලබාගැනීම අවශ්‍ය නොවේ.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ. චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ

පිටපත :- සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කා.දැ.ගැ. හා අ.ක.ස.


ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138